# රෝසා සුරංගනාවිය සහ යහළුවෝ



සෙනුකි දිහන්සා  රාජපක්ෂ

# රෝසා සුරංගනාවිය සහ යහළුවෝ

සෙනුකි දිහන්සා  රාජපක්ෂ

කතෘ

මහාමායා බාලිකා විදුහල- මහනුවර

4 E

2025/02/08

ISBN :IS37348

# පිදුම

මගේ මෙම පොත
මගේ අප්පච්චි වෙත
ඉතා ආදරයෙන්
පුදකරමි....

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදී කතෘ කරදන අත්ථදස්සි මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණ ගත්කරණී**" ව්‍යාපෘතිය හදුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හදුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙසඑළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සදහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශෂිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය- මහනුවර

එකෝමත් එක රටක අලංකාර  කැලෑවක් තිබුණා. ඒ කැලෑවෙන් එහා පැත්තේ මඩ වගුරක් තිබුණා. මඩ වගුරේ රාක්ෂයෝ තුන් දෙනෙක් ජීවත් වුනා. ඒ කැලෑවේ සුරංගනාවෝ රංචුවකුත් ජීවත් වුනා.



ඒ කැලෑවේ තිබුණ රෝස ගසකින් තමයි එයාලා එන්නේ. එයාලා සුදු පාටයි. මේ සුරංගනාවියන්ට බලයක් තිබුණා. එයාලට ගස් නිර්මාණය කරන්න පුළුවන්. ඒ වගේම එයාලා හරිම කරුණාවන්තයි. මේ සුරංගනාවියන්ට සතුන්ට උදව් කරන්න පුළුවන් බලයකුත් තිබුණා.



එකෝමත් එක දවසක අලුත් සුරංගනාවියක් ඉපදුනා. ඒ සුරංගනාවි අනිත් සුරංගනාවී වගේ නෙවෙයි. එයා රෝස පාටයි. මේ සුරංගනාවී රෝස පාට නිසා එයාගේ නම වුනේ රෝසා. ඒ වගේම එයාගේ බලයත් අනිත් අය වගේ නෙවෙයි. මේ රෝසා සුරංගනාවිට ගස් නිර්මාණය කරන්න බෑ.

මෙයාට නිර්මාණය කරන්න පුළුවන් වුනේ කටු වැල් පමණයි. රෝසා සුරංගනාවීට මේ කටු වැල් පාලනය කරන්නත් පුළුවන් වුනේත් නෑ.



එක දවසක් රෝසා සුරංගනාවී ගමනක් යනකොට දැක්කා පුංචි ලස්සන හා පැටියෙක් දර කොටයකට යට වෙලා අමාරුවෙන් ඉන්නවා.

ඒක දැකපු රෝසාට ගොඩක් දුක හිතුණා. ඉතින් මේ හා පැටියට උදව් කරන්න, රෝසාගේ කටු වැල් පාවිච්චි කලා. එත් අහම්බෙන් කටු වැල් හා පැටියාගේ ඇගේ වැදුනා.



ඒක දැකපු රෝසාගේ යාළුවෝ එයාට දොස් කීවා. මේ පුවත සුරංගනාවියන්ගේ රැජිණටත් ආරංචි වුනා.

"රෝසා, ආය ඔයා ඒ වගේ වැඩක් කලොත් මම ඔයාව පිටුවහල් කරනවා." සුරංගනා රැජිණ එහෙම කිව්වා.

සුරංගනා රැජිණ ගියායින් පස්සේ රෝසාගේ යාළුවෝ රෝසාට දොස් කියන්න පටන් ගත්තා.



රෝසාට ඉවසීම නැති වුනා. එයාට එයාවම පාලනය කරගන්න බැරි වුනා. එයා දන්නෙම නැතිව එයාගෙන් කටු වැල් නිර්මාණය වුනා.

ඉතින් රැජිණිය මැජික් දොරටුවෙන් රෝසාව පන්නා දැමුවා. එයා අහම්බෙන් වාගේ මඩ වගුර දිශාවට ගියා. එක රාක්ෂයෙක් රෝසාව දැක්කා. මේ රාක්ෂයා රෝසාට බොරුවක් කියා රාක්ෂයන්ගේ නායකයා ලගට රැගෙන ගියා.



මේ රාක්ෂයෝ තුන් දෙනාගෙන් නායක රාක්ෂයා අනිත් දෙන්නාට වඩා ලොකුයි. මේ නායක රාක්ෂයා රෝසාව රවට්ටා සුරංගනාවියන් ඉන්නා තැනට යන මැජික් දොරටුව තිබෙනා තැන ගැන සියළු විස්තර අසා දැනගත්තා.



රෝසා උදෑසන අවදි වන විට රාක්ෂයින් සිටියේ නැහැ. රෝසාට තේරුණා නපුරු දෙයක් සිදුවී ඇති බව. රෝසා ඉක්මනින් සුරංගනාවියන් ගේ ලෝකයට මැජික් දොරටුව හරහා ගියා.

එතකොට එයා දැක්කා, රාක්ෂයින් විසින් සුරංගනාවියන් සියළු දෙනාවම කූඩුවක සිරකර ඇති බව.

රෝසාට තේරුණා එයා සුරංගනාවියන්ට උදව් කලයුතු බව. ඉතින් රෝසා කූඩුවේ යතුර හිමින් සීරුවේ අර ගත්තා. එතකොටම ඒක එක රාක්ෂයෙක් දැක්කා. රාක්ෂයා රෝසාව අල්ලා ගෙන කූඩුවේ සිරකලේය.



රෝසාත්, අනිත් සුරංගනාවියන් ඉන්නා කූඩුවේම සිරවුනා.

“අනේ, රැජිණියනි මට සමාවෙන්න. මම නිසයි මෙහෙම දෙයක් වුනේ.”

“ඔයා නෙවෙයි, සමාව ගන්න ඕන අපියි. වැඩිදුර සොයා නොබලා මම ගත්ත තීරණය නිසානේ මෙහෙම දෙයක් වුනේ. අපිට සමාවෙන්න. අපි මෙතනින් බේරෙන්න ක්‍රමයක් සොයා ගන්න ඕන.”



රෝසා පොළොව දිගේ කටු වැල් අතුරුවා. ඉතිරි සුරංගනාවියන් රාක්ෂයන්ට ගල් වලින් ගැහුවා. රාක්ෂයන් කටු වැල් පැත්තට දිව්වා. රෝසා ඉක්මනින් කටුවැල් වලින් රාක්ෂයින්ව තද කර අල්ලා ගත්තා. තවත් කටුවැලකින් යතුර කූඩුව ඇතුලට ගත්තා. එයාලා ඉක්මණින් නිදහස් වෙලා, මැජික් දොරටුව ඇර, රාක්ෂයින්ව පලවා හැරියා.

නැවතත් රාක්ෂයින්ට මැජික් දොරටුවෙන් සුරංගනාවියන්ගේ ලෝකයට එන්න බැරි වෙන ලෙස මැජික් දොරටුව සදහටම වසා දැම්මා.

ඉතින් ඊටපස්සේ සුරංගනාවියන් හැමදාම සතුටින් ජීවත් වුනා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛන අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි.

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුයි. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාශිංසන.

ව්‍යපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්